# "කලලයක" ආරම්භය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විමර්ශනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

නූතන බටහිර විද්‍යාවෙහි, ජීව විද්‍යාත්මක සාධක අනුව, කලලයක ආරම්භය හා විකාශය පිළිබඳ තහවුරු කිරීම් දක්නට ඇත. නමුත්, මේ පිළිබඳ විමසීමේ දී, බටහිර විද්‍යාවට පෙර ආදි බුදුසමය තුළ ද කලලයේ ආරම්භය හා විකාශය පිළිබඳ ඉගැන්වීම් දක්නා ලැබේ. එසේම එහි විවරණයන් ථේරවාද අට්ඨකථා තුළින් ද හමුවේ. මජ්ඣිම නිකායේ, **මහාතණ්හාසංඛය සූත්‍රය** අනුව, ලොව පහළ වන්නා වූ සත්ත්ව කොට්ඨාස හතරකි. 1.අණ්ඩජ 2.ජලාබුජ 3.සංසේදජ 4.ඕපපාතික යනුවෙනි. මෙම සත්ත්ව කොට්ඨාස අතර, **අණ්ඩජ** හා **ජලාබුජ** සත්ත්ව කොට්ඨාසයන් පමණක් කලලය පදනම්ව නිර්මාණය වන බව ආදි බෞද්ධ ඉගැන්වීමයි. මීට අමතරව සංයුත්ත නිකායේ, **යක්ඛ සංයුත්තයේ** දී කලලයක නිර්මාණය සඳහා පදනම් වන්නා වූ මූලික කරුණු තුනක් දක්වා ඇත. 1.මව පිරිසිදු වීම, 2.මව හා පියාගේ සංවාසය, 3.ගන්ධබ්බයෙකුගේ පැමිණීම. මෙම කරුණු අතර, ගන්ධබ්බයකුගේ පැමිණීම පිළිබඳ අදහස බුදුසමයට පමණක් සීමා වූ, එමෙන්ම බටහිර විද්‍යාව තුළ සාකච්ඡා නොවන්නා වූ කරුණකි. ඉහත දක් වූ කලලය, රූප කලාපයන් සමූහයකගේ එකතුවෙන් නිර්මාණය වන්නකි. එසේ නිර්මාණය වන්නා වූ කලලය ද, තල තෙල් බිඳුවක් යම් බඳු ද, පිරිසිදු ගිතෙල් බිඳුවක් යම් බඳු ද, එවැනි ප්‍රමාණයකින් යුක්ත බව **විසුද්ධි මාර්ගයේ** දී දක්වා ඇත. මෙම කලලයාගේ පැවැත්ම දින සතකි. ඉන් අනතුරුව එය මෝරා, සමූහාකාර වන්නේ, කලලාකාරය අතහැර "**අබ්බුද**" නම් වූ ස්වරූපයට පැමිණේ. **අබ්බුද** තත්වය ද සතියක් පමණ කාලයක් පවතින අතර, එය ද මෝරා සමූහාකාර වී, "**පේසි**" නම් වූ අවස්ථාවට පැමිණේ. **පේසි** අවස්ථාවේ පැවැත්ම ද සතියකි. ඉන් අනතුරුව එය "**ඝන**" නම් වූ අවස්ථාවට පැමිණෙන අතර, මෙහි දී මුල් කලලය, කිකිළියකගේ බිත්තරය යම් බඳු වේ ද, ඒ ආකාර සටහන් ඇත්තේ වේ. පස්වන සතියේ දී **ඝන** අවස්ථාවෙහි වූ ස්වරූයෙහි සත්වයාගේ හිස හටගන්නා තැන එක් බුබුලක් ද, අත් හටගන්නා තැන බුබුළු දෙකක් ද, පා හටගන්නා තැන බුබුළු දෙකක් ද, යනුවෙන් බුබුළු පහක් නිර්මාණය වේ. ඉන් අනතුරුව එම බුබුළු ක්‍රමයෙන් වැඩී ඇස්, කන්, නාසාදිය ද, කෙස්, ලොම්, නිය, ද පහළ වේ. ආදි බුදුසමයට අනුව මෙම කලලය ජීවියෙකු බවට පත් වන්නේ ගන්ධබ්බයෙකුගේ පැමිණීම හෙවත් විඤ්ඤාණයේ සම්බන්ධයත් සමඟය. යම් හේතුවක් මත විඤ්ඤාණය උක්ත සාධකයන්ගෙන් ඉවත් වේ නම්, එහි දී කලලයෙහි වර්ධනය කිසිසේත්ම සිදු නොවේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් උක්ත ඉගැන්වීම් පිළිබඳ මූලාශ්‍රයමය සාධක පදනම් කොට ගනිමින් විමර්ශනය කිරීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පදඃ කලලය, සත්ත්ව, ගන්ධබ්බ, රූප කලාප, විඤ්ඤාණය